අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

Presidential Task Force for Essential Services
58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறிப்பு / My Ref. PTF/01/Circular/01 — ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref. — දිනය / திகதி / Date 2020.04.15

චක්‍රලේඛ අංකය : PTF/03/2020 (ii)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ**

**ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>උද්ගත වී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ පොරොත්තු ලේඛන ගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු.5000/- ක දීමනාවක් ගෙවීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක PTF/03/2020 හා 2020.03.31 දිනැති සහ අංක PTF/03/2020(i) හා 2020.04.03 දිනැති චක්‍රලේඛ වලට වැඩිමනත් වශයෙනි.

02. රට තුළ අඛණ්ඩව ඇඳිරි නීතිය ක්‍රියාත්මකවීම හේතු කොට ගෙන, එදිනෙදා ජීවනෝපායන් අහිමි වීම නිසා බොහෝ පවුල් ඒකකයන් ජීවත්වීමට මාර්ගයක් නොමැති වීමෙන් අසරණභාවයට පත්ව ඇති බැවින්, ඔවුන්ට අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ගෙවීමට යෝජිත රු. 5,000 දීමනාව කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතු ය. මෙම කාර්යය ඉතා කෙටි කාලයකින් සිදුකිරීම අසීරු කාර්යයක් වුව ද, එවැනි තත්ත්වයක දී පවා මහත් පරිශ්‍රමයක් දරමින් ජනතාවට ලබා දිය යුතු සහන නොපමාව ලබා දීමට කටයුතු කිරීම බෙහෙවින් අගය කරමි.

එහෙත්, මෙම කාර්යය උපරිම විනිවිදභාවයකින් හා සාධාරණත්වයකින් සිදු කිරීමටත්, ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන සියලු පවුල් ඒකක වෙත එම ප්‍රතිලාභ ලබා දීමටත්, සුදුසුකම් නොලබන පවුල් ඒකකවලට එම ප්‍රතිලාභ ගෙවීම වැළැක්වීමටත් කටයුතු කළ යුතු වේ. PTF/03/2020/(i) චක්‍රලේඛයේ (3) ඡේදයට අනුව, මෙම ප්‍රතිලාභ ලබා දීම සඳහා සකස් කරන ලද පොරොත්තු ලේඛනවල මිලියන 1.9ට වැඩි පවුල් ඒකක සංඛ්‍යාවක් ඇතුළත් බවට වාර්තා වී ඇත. එබැවින්, පොරොත්තු ලේඛනයේ සඳහන් ප්‍රතිලාභීන් නැවත සමාලෝචනයකට ලක් කර, සුදුසුකම් නොලබන පවුල් ඒකක පොරොත්තු ලේඛනයට ඇතුළත් වී ඇති නම්, ඔවුන් පොරොත්තු ලේඛනයෙන් ඉවත් කිරීමටත්, පවතින තත්ත්වය මත සැබෑ වශයෙන් ම ජීවනෝපය අහිමි වී ඇති, මෙම ප්‍රතිලාභ ලබා දීමේ දී ප්‍රමුඛතාවය ලබා දිය යුතු හා දැනටමත් පොරොත්තු ලේඛනයට ඇතුළත් වී නොමැති, එහෙත්, ඇතුළත් කළ යුතු පවුල් ඒකක වේ නම්, එවැනි පවුල් ඒකක ලේඛනයට ඇතුළත් කර ප්‍රමුඛතාවයක් ලබා දීමටත් කටයුතු කළ යුතු ය.



කාර්යාලය / அலுவலகம் / Gen. Office 2575317, 2575318 — ෆැක්ස් / பெக்ஸ் / Fax 2574143, 2575454, 2575310 — විද්‍යුත් තැපෑල / ஈ மெயில் / E-mail secpm@pmoffice.gov.lk

ඒ අනුව, දැනටමත් පොරොත්තු ලේඛනයේ සිටින සෑම පවුල් ඒකකයක් ම ඇමුණුම (01) ආකෘතිය මඟින් ග්‍රාමීය කමිටුවට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කල යුතු ය. ඒ සඳහා, පළාත් පාලන ආයතනවල පළාත් පාලන කොට්ඨාස (Ward) නියෝජිතයන්ට අමතරව, එම පළාත් පාලන ආයතනයේ ඕනෑම නියෝජිතයෙකුට/ ඕනෑම දේශපාලන පක්ෂ නියෝජිතයෙකුට/ ඕනෑම සිවිල් සංවිධාන නියෝජිතයෙකුට මෙම ග්‍රාමීය කමිටුව වෙත යම් පවුල් ඒකකයක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලැබීම/නොලැබීම පිළිබඳව මෙන් ම, ප්‍රමුඛතාවය ලබා දීම පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දිය යුතු ය. එම කරුණු ඉදිරිපත් කිරීම සලකා බලා ග්‍රාමීය කමිටුව විසින් සුදුසුම ප්‍රතිලාභීන් තෝරා ගෙන, නිර්දේශ සහිතව, එම ප්‍රතිලාභී පවුල් ඒකක නාම ලේඛනය පහත සඳහන් ආකෘතිය මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත 2020.04.19 දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

**තෝරා ගත් ප්‍රතිලාභී පවුල් ඒකක පිළිබඳ විස්තරය** **ග්‍රාම නිලධාරි වසම :**

| අනු අංකය | ගෘහ අංකය | නම | ජා.හැ. අංකය | නිර්දේශය | වෙනත් |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |

ඉහත ලේඛනයේ නම් සඳහන් කර ඇති සියලු පවුල් ඒකක වෙත රු. 5,000 දීමනාව ලබා දීමට සුදුසු බවට මෙයින් සහතික කරමි.

කමිටු සාමාජිකයින්

1.　　4.
2.　　5.
3.　　6.

දිනය :

එලෙසම, ප්‍රතිලාභීන් වශයෙන් ප්‍රතික්ෂේප වූවන්ගේ නාම ලේඛනය, ඉහත සඳහන් පරිදි ම සකස් කොට ග්‍රාමීය කමිටුවේ නිර්දේශය සමඟ ග්‍රාම නිලධාරි/සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් තබා ගත යුතු ය.

03. මෙම ප්‍රතිලාභ ගෙවීමේ දී පහත සඳහන් ක්ෂේත්‍ර නියෝජනය කරන පවුල් ඒකක ද පවතින තත්ත්වය හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ කණ්ඩායම් වශයෙන් හඳුනාගත හැකි ය. එම පවුල් ඒකක තෝරා ගැනීමේ දී ඉහත (2) ඡේදයේ විස්තර කර ඇති ආකාරය අනුව කටයුතු කළ යුතු ය.

3.1 **ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව සේවා සපයන කණ්ඩායම්**

උදාහරණ වශයෙන් ඉදිකිරීම් කර්මාන්තයට ගඩොල්,වැලි ආදී අමුද්‍රව්‍ය සැපයීම මෙන්ම වඩු, පෙදරේරු, ජලනල, විදුලි කාර්මික, පින්තාරු වැනි ක්ෂේත්‍රවල නියැළුණු පුද්ගලයන් හා එම කාර්යන් සඳහා අත්උදව් සපයන ලද කුලීකරුවන් වැනි වෘත්තීන්වල යෙදෙන්නන්

3.2 **කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරතවන්නන්**

උදාහරණ වශයෙන් රසකැවිලි කර්මාන්තය, කොහු, පාපිසි කර්මාන්තය, සමරුඑලක, බතික්, ලෝහ වැනි සුළු පරිමාණ කර්මාන්තකරුවන්

3.3 **ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් සේවා සපයන්නන්**

උදාහරණ වශයෙන් රූපලාවන්‍ය ආයතන, උත්සව භාණ්ඩ, උපකරණ හා සේවා සපයන්නන්, ත්‍රිවීල් හා මෝටර් සයිකල් අලුත්වැඩියා කරන්නන්, ඇඳුම් මසන්නන්, කොණ්ඩා කපන්නන්, ත්‍රි රෝද රථ රියදුරු වැනි වෘත්තීන්වල යෙදෙන්නන්

3.4 **ග්‍රාමීයව අලෙවිකරණයේ යෙදෙන්නන්**

උදාහරණ වශයෙන් පවතින තත්ත්වය හමුවේ මාළු, එළවලු, පලතුරු වෙළඳමේ යෙදීමට නොහැකි වූ පුද්ගලයන්, ආගමික ස්ථාන ආශ්‍රිතව හා පෞද්ගලික මට්ටමින් ඒ හා සමාන වෘත්තීන්වල යෙදෙමින් ජීවිකාව පවත්වාගෙනයන්නන් වැනි වෘත්තීන්වල යෙදෙන්නන්

04. මීට අමතරව, දැනටමත් මධ්‍යම රජයෙන් හෝ පළාත් සභා මඟින් නිර්දේශ කර එවා ඇති පෙර පාසල් ගුරුවරුන්, පුද්ගලික බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන්, රජයේ සේවයේ නොයෙදෙන ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්, හස්ත කර්මාන්ත කරුවන්, අත්යන්ත්‍ර පේෂකර්මාන්තකරුවන්, උසාවි මගින් නඩත්තු දීමනා ලබන කාන්තාවන්, ආදායම අහිමි කුඩා තේවතු හිමියන් හා ප්‍රාදේශිය මාධ්‍යවේදීන් යන රැකියා කාණ්ඩවල පවුල් ඒකක ද මෙම දීමනාව ගෙවීම සඳහා පොරොත්තු ලේඛනවලට ඇතුළත් කර ගත යුතු ය.

05. සුදුසුකම් ලබන ප්‍රතිලාභීන් එක් අයෙකුට වඩා වැඩියෙන් එක් පවුල් ඒකකයක සිටින අවස්ථාවක දී එක් පවුල් ඒකකයකට එක් වරක් පමණක් ගෙවන දීමනාවක් සේ සලකා කටයුතු කළ යුතු ය. එලෙසම, ප්‍රතිලාභ ගෙවීමේ දී එම පවුල් ඒකකවලට මෙම සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ වෙනත් දීමනාවක් ලබා නොගත් බවට සහතිකයක් ඔවුන්ගෙන් ලබා ගත යුතු ය. ඉහත සඳහන් පරිදි ප්‍රතිලාභීන් වශයෙන් තෝරා ගත් පවුල් ඒකකවල සංඛ්‍යාත්මක විස්තර, දිස්ත්‍රික් ලේකම් මඟින් නොපමාව ලේකම්, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු වේ.

06. **මෙම ප්‍රතිලාභීන් තේරීමේ ක්‍රියාවලිය 2020 අප්‍රේල් මස 17 හා 18 දින ආරම්භ කර 2020 අප්‍රේල් 19 දින හෝ ඊට පෙර ග්‍රාමීය කමිටු නිර්දේශ සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම ගෙවීම් 2020 අප්‍රේල් මස 20, 21, 22 යන තෙදින තුළ දී සෞඛ්‍ය අංශ විසින් ලබා දෙන උපදෙස් හා නිර්දේශ අනුගමනය කරමින් ගෙවා අවසන් කළ යුතු ය.**

07. උද්ගතව ඇති තීරණාත්මක තත්ත්වය යටතේ ශ්‍රී ලාංකේය ජනතාවට සාමාන්‍ය ජන ජීවිතය යථා පරිදි පවත්වා ගෙන යාම සඳහා ඔබ විසින් ඉටු කරනු ලබන මෙහෙය කෘතවේදීව අගය කරමි.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරි- අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම,
සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අමාත්‍ය මණ්ඩල ලේකම්
03. විගණකාධිපති

} කාරුණික දැන ගැනීම සඳහා

04. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
05. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
06. ලේකම්, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

} අවශ්‍ය කටයුතු සඳහා

## <u>රටේ උද්ගත වී ඇති තත්ත්වය අනුව ජීවනෝපාය අහිමිවීම මත රජයෙන් ලබාදෙනු ලබන රු.5000/- දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රය</u>

1. ගෘහ මූලිකයගේ නම :
2. පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව :
3. ජාතික හැඳුනුම්පත් අංකය :
4. උපන් දිනය :
5. ස්ථිර පදිංචි ලිපිනය :
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:
7. ග්‍රාම නිලධාරී වසම :
8. ගෘහ අංකය :
9. කරන ලද රැකියාව :
10. එම රැකියාව සම්බන්ධයෙන් ලියාපදිංචියක් සිදුකර ඇත්නම්, ලියාපදිංචි අංකය:
11. ලියාපදිංචි කරන ලද ආයතනය:
12. රජයෙන් රු.5000/- දීමනාව ඉල්ලීමට හේතුව:

.......................................................................................................................
.......................................................................................................................
.......................................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය :

........................................
අයදුම්කරුගේ අත්සන

---

*<u>කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා</u>*

........................................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........................................ ග්‍රාම නිලධාරි වසමේ පදිංචි ..........................................................................වන මම, 2020.04..........දින කොරෝනා වෛරසය පැතිරීයාම හේතුවෙන් අඛණ්ඩව ඇඳිරි නීතිය පැනවීම නිසා ජීවනෝපාය අහිමි වූ පවුල් ඒකකයක් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි රජය මගින් ලබා දෙන රු. 5000/= ක දීමනාව ලබා ගත් බව මෙයින් සහතික කරමි.

........................................
භාර ගත් බවට අයදුම්කරුගේ අත්සන

**සාක්ෂි:**

01. ග්‍රාම නිලධාරි නම.......................................... අත්සන ..........................................
02. සමෘද්ධි සංවර්ධන නිලධාරි නම .......................................... අත්සන ..........................................

දිනය :